# අවිහිංසාව සහ ජීවහිතවාදය බෞද්ධ ආර්ථිකයේ සුරක්ෂිතතාවයට ඇති ආවශ්‍යකත්වය

පූජ්‍ය තිස්සමහාරාමයේ ඉන්ද්‍රනන්ද හිමි
ගෞරව ශාස්ත්‍රවේදී උපාධි අපේක්ෂක
භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

අධික ජනගහනය, නාගරීකරණය හා තාක්ෂණික දියුණුව පාදක කොටගත් කාර්මීකරණයේ අනිසි පලයක් වශයෙන් ඉතා වේගවත් ලෙසත්, බිය ජනක ලෙසත්, පෘථිවිය මනුෂ්‍යවාසයට නුසුදුසු ස්ථානයක් බවට පෙරළීගෙන එතැයි දැන් නන්දෙසින් හඬ නැගෙනු ඇසෙයි. භෞතික පරිසරය දූෂණය වීමේ හා එහි ස්වභාවික බව විනාශ වීමේ දී භයානක තර්ජනයකට ලොව මුහුණ පා සිටින අවදියක ආගමික උතුමන්ගේ ජීවිතය ඇසුරින් හා දේශනාවන් ඇසුරින් එම විපතින් අත්මිදෙනු පිණිස කවර මග පෙන්වීමක් ලැබේදැයි විමසා බැලීම අතිශයින් ම වැදගත් වෙයි. වායු දූෂණය , ජල දූෂණය , ශබ්ද දූෂණය හා පාංශු දූෂණය ද ස්වාභාවික තුරුලතාවන් හා තිරිසන් සතුන් විවිධ අතවරයන්ට ලක්වීම හා වැනසී යාම ද ඔස්සේ භෞතික පරිසරයට සිදුවන අනතුර පිළිබඳ ව මුලුමහත් ලෝකයම තැතිගෙන සිටින මෙවන් අවදියක අනේක විධ සම්පත්තින් හා ශක්තීන්ට තෝතැන්නක් වූ ද, සොබා දහමේ අසිරිමත් බව හා සොඳුරු බව විසින් අගතැන්පත් වූ ද, එම උතුම් දායාදය කෙරෙහි බුදු සිරිතත් බුදු දහමත් තුළින් දක්වා ඇති සුහද ආකල්පය වටහා ගැනීම බෙහෙවින් ම ප්‍රයෝජනවත් වනු ඇත.[1]

සමස්ත බුදු දහම පුරා ම දක්නට ලැබෙනුයේ අවිහිංසාව සහ ජීව හිතවාදයයි. බෞද්ධයාගේ නිත්‍ය සීලය වන පංච සීලය තුළින් ද මෙය මැනවින් අවබෝධ කරගත හැකි ය.

සතුන් මැරීම, සොරකම, කාමය වරදවා හැසිරීම, මුසාවාදය සහ සුරාපානය යන කරුණු වලින් වැලකීම පංචසීල ප්‍රතිපත්තිය වේ. මේ සිල් ප්‍රතිපදාව පොරොන්දු වීමක් මෙන් ම ප්‍රතිපත්ති ගරුක ව රැක ගැනීම ද බුදු සමය අපේක්ෂිත ය. උතුම් චර්යා ධර්ම සමුදායකින් පිරි පංචසීලමය මුළු



විශ්වයම මිනිස් ගුණ දහමින් එකට බන්ධනය කරන, සවිමත් යදම් මාලාවක් වැනි ය.

එසේ ම පංච ශීලය ම අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙක සම්බන්ධ වන එකම ජාලයක් වැනිය. එක ශික්ෂාවක් කඩකරමින් සතරක් රැකීම හෝ සතරක් කඩකරමින් එක ශික්ෂාවක් රැකිම හෝ බුදු සමය අපේක්ෂා නොකරයි.[2]

බුදු සමය තුළ ආචාර විද්‍යාව උසුලන්නේ සුවිශේෂී ස්ථානයකි. නිර්වාණය ද වූකලී සදාචාරාත්මක පාරප්‍රාප්තියයි. සදාචාර මාර්ගයේ මූලික පදනම පංච ශීලයයි. පංච ශීලයේ ප්‍රථම ශික්ෂා පදයෙන් අවධාරණය කෙරෙන්නේ අවිහිංසාවයි. මෛත්‍රියයි. එය හුදෙක් මානව හිතවාදී සංකල්පයක් පමණක් නො වේ. ඉන් ඔබ්බට ගිය සත්ත්ව හිතවාදී සංකල්පයක් ද වෙයි. මිනිසා හා සත්ත්වයන්ට ලොව හුදකලාව විසිය නොහැකි ය. ගහ කොළ හා දිය ඇලි , වායුව ආදී විශ්ව පරිසරය ම සත්ව ජීවිත හා බැඳී පවතී. මෙසේ හෙයින් බුදු සමය තුළ **"සබ්බ පාණභූත හිතානුකම්පී"** විය යුතු බව අවධාරණය කෙරෙයි. සබ්බ පාණභූත හිතානුකම්පී යනු සියළු ප්‍රාණීන්ට සියළු භූතයන්ට හිතවාදී වීම ය. එය මානව හිතවාදී සත්ත්ව හිතවාදී මෙන්ම භූත හිතවාදී ද වෙයි. මෛත්‍රිය යි විශ්ව හිතවාදයයි.[3]

බුදු දහම පරපණ නැසීමට සම්පූර්ණයෙන් විරුද්ධ ය. ගිහියන්ටත් පැවිද්දන්ටත් , එය තහනම් කරමින් පැණ වූ විධි නියම පාලි ත්‍රිපිටකයේ ඇත. ශික්ෂාපදයේ එන "පාණ" ශබ්දයෙන් අදහස් වන්නේ කුමක්දැයි සොයා බැලීම සුදුසු ය.

බොහෝ සූත්‍රයන්හි සඳහන් වන පරිදි භික්ෂූන් වහන්සේලා විෂයෙහි එක්තරා අවධියක පැණ වූ විධි නියමය

**පාණාතිපාතං පහාය පටිවිරතො හොති**
**නිහිත දණ්ඩො නිහිත සත්ථා**
**ලජ්ජී දයා පන්නො සබ්බපාණභූත**
**හිතානුකම්පී විහරති" යන්න ය**[4]

මෙම අනුශාසනය ක්‍රියාත්මක වූ යුගයෙහි ප්‍රාතිමෝක්ෂ ශික්ෂාපද සමූහයක් හෝ සාමනේර උපසම්පන්න ප්‍රභේදය හෝ නො වීය. එම ප්‍රභේදය ඇති වී ප්‍රාතිමෝක්ෂ ශික්ෂා දෙසීමට පටන්ගත් යුගයෙහි ඉහත දැක් වූ විධි නියමය ආකාර කිහිපයකින් ශික්ෂාපද බවට පරිවර්තනය විය. සාමණේර භික්ෂූන් වහන්සේලා විෂයෙහි " මම පරපණ නැසීමෙන් වැළකෙමි." යන්න වලංගු කෙරිණ. උපසම්පන්න භික්ෂූන් වහන්සේලා විෂයෙහි පරපණට කළ හැකි හානිය ක්‍රම කිහිපයකින් ප්‍රකාශයට පත්විය.

පළමුව, උපසම්පන්න භික්ෂූන් වහන්සේ කෙනෙකු මිනිසෙකුගේ ජීවිතයක් තොර කළ හොත් එය පාරාජිකයක් හැටියට ද [5] අන් සතෙකුගේ ජීවිතයක් තොර කළහොත් එය පාචිත්‍යයක් හැටියට ද සැලකිණ. මෙයින් පෙනී යන්නේ "පාණ" ශබ්දයෙන් මනුෂ්‍ය ප්‍රාණයත් සත්ව ප්‍රාණයත් යන ප්‍රාණ දෙකක් අදහස් කොට ඇති බව ය. මෙබඳු විශේෂයක් සාමණේර භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් විද්‍යාමාන නොවේ. පාරාජිකා , පාචිත්තියාපත්ති වැනි ඇවැත්වලින් කියවෙන්නේ භික්ෂූන් වහන්සේ කෙනෙකු සංඝ සමාජය තුළ දරණ ස්ථාවරත්වයෙ ඇතිවන වෙනස්කමක් පමණකි. කිසියම් ක්‍රියාවක කුශලාකුශල කර්ම විපාක පිළිබඳ ව තීරණයක් එයින් ගම්‍යමාන නොවේ.

ජීවයත් ප්‍රාණයත් අතර වැඩි වෙනසක් නැත.. ප්‍රාණයට හානි කිරීම තහනම් කරමින් පැණ වූ පාචිත්තිය ශික්ෂාවක්ම ජීවයට හානි කිරීම සම්බන්ධයෙන් පනවා තිබීමෙන් පෙනී යන්නේ ප්‍රාණයත් ජීවයත් සමානත්වයෙහි ලා සලකා ඇති බවය.





එම නිසා යටත් පිරිසෙයින් උපසම්පන්න භික්ෂූන් වහන්සේලා සම්බන්ධයෙන් පමණක්වත් තුන්වැනි ප්‍රාණයක් සැලකිල්ලට ගෙන තිබේ. එය "ශාක ප්‍රාණ" යනුවෙන් හැඳින්විය හැකි ය. විවිධ වගා හා තෘණ බිම් පාගා විනාශ කරන අය සහ පොළව කණින අය ද මෙම වරදට හසුවන සේ ගනන්ගෙන ඇත. අප ඉදිරියේ ඇති ප්‍රශ්නය නම් ශාක ප්‍රාණයට හානි පැමිණවීම ගිහියන්ට ද තහනම් කරන විධියේ උපදේශයක් මුල් බුදුසමය තුළ විද්‍යාමාන වී ද යන්නයි.[8]

පණ ඇති අය හැඳින්වීම පිණිස ප්‍රාණ, භූත සහ සත්ත යන පද තුන ම පාලි ත්‍රිපිටකය තුළ උපයෝගී කොට ගෙන ඇත. සුත්ත නිපාතයේ එන මෙත්ත සූත්‍රයේ මේ පද තුන විශේෂයෙන් ප්‍රාණීන්ගේ ජාති විභාගය ඇති සැටියෙන් ද අනුපිළිවෙලට ද දක්වයි. ඒ ඇති සැටිය හා අනුපිළිවෙල මෙසේ ය.[10]

(i) වෘක්ෂ හා තණ
(ii) මෙරු සහ කුඹීන් ඇතුළු කෘමීහු
(iii) සිවුපාවෝ
(iv) උරගයෝ
(v) මත්ස්‍යයෝ
(vi) පක්ෂීහු

ඉහත දැක් වූ ප්‍රාණීන් අතර විවිධ විශේෂයන් ඇති බව ඒ ඒ තැන ප්‍රකාශ කරන බුදුරජාණන් වහන්සේ ප්‍රාණීන්ගේ ඇති සැටිය හා අනුපිළිවෙල සමාන කොට ඇත්තේ මිනිසුන් අතර විවිධ වර්ග සහ විශේෂයන් නැති බව ප්‍රකාශ කිරීමෙනි. මිනිසාගේ විශේෂත්වය වාසෙට්ඨ සූත්‍රය තුළ පැහැදිලිව පිළිගැනී ඇති බව ප්‍රාණීන් ගේ අනුපිළිවෙල මිනිසාගෙන් අවසන් කොට තිබීමෙන් පෙනී යයි. මෙහිදී විශේෂ වශයෙන් වැදගත් වන්නේ ත්‍රිවිධාකාර ප්‍රාණයට එනම් මනුෂ්‍ය සත්ව හා ශාක ප්‍රාණ ශබ්දයෙන් ගැනීමට වාසෙට්ඨ සූත්‍රය කිසිදු පැකිලීමක් දක්වා නොතිබීමයි.

මෙහිදී අවධාරණය කළයුතු කරුණ නම් මිනිසුන්ට සතුන්ට මෙන් ම ශාකවලට ද පණ ඇතැයි මුල් බුදු සමය කියා සිටින බවයි. ශාක ප්‍රාණය මනුෂ්‍ය සහ සත්ව කාණ්ඩ තරමට දියුණු නැති බව ද වාසෙට්ඨ සූත්‍රයෙන් ගම්‍යමාන වෙයි. මේ සියල්ලෙන් පෙන්නුම් කරනුයේ අවිහිංසාවයි. ජීව හිතවාදයයි.

දැන් අපි සුත්තනිපාතයේ ධම්මික සූත්‍රයේ එන වැදගත් සඳහනකට අවධානය යොමු කරමු. එහි දී ගිහියෙකු හොඳ උපාසකයෙක් වන්නේ කවර සදාචාරාත්මක ප්‍රතිපත්ති සමූහයක් මත දැයි දක්වා ඇත. ඊට ගිහිවත යන නම ද එහිදී යෝජිත ය. භික්ෂූන් වහන්සේලාට පැවරෙන කටයුතු කිරීම ගිහියනට අපහසු බැවින් ඔහු කළ යුත්තේ එම ගිහිවත අනුගමනය කිරීම යැයි සූත්‍රයේ තවදුරටත් සඳහන් වේ.

ගිහියන්ට පැවරෙන සදාචාර ප්‍රතිපත්ති අතර මුල් තැනක් ගන්නේ ඔහු ප්‍රාණය නොනැසිය යුතු ය. අනුන් ලවා නොනැසවිය යුතු ය. අනුන් පණ නසනු නො ඉවසිය යුතු ය හෝ ථාවර වශයෙන් ගැනෙන සියලු ප්‍රාණීන්ට හිංසා පීඩා කිරීමෙන් ඔහු වැළකිය යුතු ය." යන්නය.[11]

මේ අනුව ප්‍රථම ශික්ෂා පදය සමාදන් වන්නා වූ මිනිසුන්ට හා සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමට පමණක් නොව ශාක ප්‍රාණයට කරදර කිරීමෙන් වැළකී සිටීමට ද බැඳී සිටී. මුල් බුදු සමය අනුව ශාක ජීවිතය ආරක්ෂා කිරීමේ යුතුකම භික්ෂූන්ට මෙන් ම ගිහියන්ට ද පැවරෙන බව තීරණය කිරීමට මෙය හොඳට ම ප්‍රමාණවත් ය.

එහෙත් ප්‍රායෝගික දුෂ්කරතා පිළිබඳ මනා අවබෝධයක් තිබුණු බුදුරජාණන් වහන්සේ මේ කරුණ සම්බන්ධයෙන් වෙන ම ශික්ෂා පද ගිහියන් උදෙසා පැනවීමට උනන්දු නොවූ සේක. ගිහියන් උදෙසා ජෛන සමයෙහි පණවා ඇති දරදඬු බරපතල නීතිරීති බුදු සමයෙහි දක්නට නැති බව සැබෑ ය. එහෙත් ශාක ප්‍රාණය සම්බන්ධයෙන් අනුන් ලවා නොනැසවිය යුතු ය. අනුන් පණ නසනු නොඉවසිය යුතුය. තස හෝ ථාවර වශයෙන් ගැනෙන සියලු ප්‍රාණීන්ට හිංසා පීඩා කිරීමෙන් ඔහු වැළකිය යුතු ය." යන්නය.





මේ අනුව අපට ශික්ෂා පදය සමාදන් වන්නා වූ මිනිසුන්ට හා සතුන්ට හිංසා කිරීමෙන් වැළකීමට පමණක් නොව, ශාක ප්‍රාණයට කරදර කිරීමෙන් වැළකී සිටීමට බැඳී සිටී. මුල් බුදු සමය අනුව ශාක ජීවිතය ආරක්ෂා කිරීමේ යුතුකම භික්ෂූන්ට මෙන් ම ගිහියන්ට ද පැවරෙන බව තීරණය කිරීමට මෙය හොඳට ම ප්‍රමාණවත් ය.

එහෙත් ප්‍රායෝගික දුෂ්කරතා පිළිබඳ මනා අවබෝධයක් තිබුණු බුදුරජාණන් වහන්සේ මේ කරුණ සම්බන්ධයෙන් වෙන ම ශික්ෂා පද ගිහියන් උදෙසා පැනවීමට උනන්දු නොවූ සේක. ගිහියන් උදෙසා ජෛන සමයෙහි පණවා ඇති දරදඬු බරපතල නීතිරීති බුදු සමයෙහි දක්නට නැති බව සැබෑ ය. එහෙත් ශාක ප්‍රාණය සම්බන්ධයෙන් තමාගේ අභිමතය පරිදි ක්‍රියා කිරීමේ සම්පූර්ණ නිදහස ගිහියාට ලැබෙන පරිදි මුල් බුදු සමය තේරුම් ගැනීම වැරදි බව ධම්මික සූත්‍රයෙන් මනාව පැහැදිලි වෙයි. එය නිසැකයෙන් ම ශාක ජීවිතය කෙරෙහි ගිහියා දැක්විය යුතු ආකල්පයේ සීමාවක් ඇතිබව මනාව කියාපායි. හිතාමතා ශාක ලෝකය විනාශ කිරීමට මිනිසා ගන්නා නිරර්ථක සහ අත්‍යවශ්‍ය ක්‍රියාදාම පරපණ නැසීමට තුඩු දෙන දේ හැටියට සැලකීමට ගිහියා උනන්දු විය යුතු බව **ධම්මික සූත්‍රයේ** අනුසාසනය වේ.

භෞතික පරිසරය වූ කලී මනුෂ්‍ය වර්ගයා සතු උත්තම දායාදයෙකි. මානව වර්ගයාගේ යහ පැවැත්මට අත්‍යවශ්‍ය වූ විවිධ ශක්තීන්ගෙන් පිරිපුන් , සැකැස්මෙන් හා ක්‍රියාකාරීත්වයෙන් විවිධ වූ විචිත්‍ර වූ සුන්දර වූ එය සොබාදහමෙහි විශ්මිත නිමැවුමකි. මානව ජීවිතය හා සංස්කෘතික පරිසරය විසින් නන් අයුරින් පෝෂණය කරනු ලැබේ. හැඩ ගස්වනු ලැබේ. අප විසින් එය අවශ්‍යයෙන් ම රැකගත යුතු ය. ඒ කෙරෙහි බැතිමත් සුහද ආකල්පයක් දැරිය යුතු ය.

බුදුරජාණන් වහන්සේ වූ කලී නිසැකව ම මේ සියල්ල පිළිබඳ ගැඹුරු අවබෝධයකින් ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයෙකි. උන්වහන්සේ පරිසරය දෙස නිකෙලෙස් ඇසින් බැලූ එහි ඇළුම් කළ එය රැකගැන්මට මග පෙන්වූ උතුමකුයැයි කිවයුතුය. [12]

පරිසරය යනු මිනිසා ද ඇතුළුව ඔහු වෙසෙන ජීව අජීව වටපිටාවයි. මිනිසාද ඇතුළු සියලු ම ජීවීන්ගේ පැවැත්ම රඳා පවතින්නේ පරිසර සමතුලිතතාව මත වේ. ජීවියෙකුට අවශ්‍යය මූලික ම අවශ්‍යතාවයන් වන ජලය , වාතය, ආහාර, නිවාස , ඇඳුම් ආදී සකලවිධ උවමනාවන් ඉටු කර ගන්නේ පරිසරයෙනි.

වර්තමාන ලෝකයේ ජීවීන් අතර සාමය හා සහජීවනය වචනවලට පමණක් සීමා වී ඇති බව පැහැදිලිය. ලෝක ගෝලය උණුසුම් වීමේ ක්‍රියාවලිය අනුක්‍රමයෙන් වර්ධනය වෙමින් පවති. නූතන තාක්ෂණික මිනිසාගේ සිමා රහිත තෘෂ්ණාව හේතු කොට ගෙන මිහිතලය මත සියලු ජීවීන්ට අහිතකර තත්වයක් උද්ගත වෙමින් පවතී. සීමා රහිත තෘෂ්ණාවන්ගෙන් තෘප්ත වීමට මිනිසා ගන්නා උත්සාහයේදී ඊට නූතන විද්‍යා තාක්ෂණයෙන් ලැබෙන දායකත්වය ලෝක ඉතිහාසයේ අන් කවරදාකවත් දක්නට නො ලැබුණු පරිසර විනාශයකට හේතු වී ඇත.

පරිසරය තමාගෙන් බැහැර ව තමා උදෙසා පවතින්නක් බව පරිසරය පිළිබඳ බටහිර ආකල්පය වන මුත් , ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ තමා ද පරිසරයෙන් වෙන් නොවුණ පරිසරයේම කොටසක් බවයි.

පරණ ගිවිසුමේ උප්පත්ති කථාවේ දැක්වෙන පහත පාඨයෙන් මිනිසා නොවන පරිසරය පිළිබඳ ව දක්වන යුදෙව් ආකල්පයේ ස්වභාවය පැහැදිලි වේ.

"නුඹලා බෝවී වැඩෙමින් පොළොව පූර්ණ කොට ඒක යටත් කොට ගනිව්. මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයේ පක්ෂීන් කෙරෙහිද පොළොව පිට හැසිරෙන සියළු සතුන් කෙරෙහිද අධිපතිකම් කරව් යැයි කී සේක.

තවද දෙවියන් වහන්සේ ,

බලව , මුළු පොළෝතලයෙහි ඇති බීජ දරන ඵල ඇති සියළු වෘක්ෂයන්ද නුඹලාට දුනිමි. ඒ නුඹලාට ආහාර පිණිස වන්නේය.[13]





මේ අනුව පෙනී යන්නේ මෙම ආගම් තුළ අවිහිංසාවාදී බවක් හෝ ජීවහිතවාදී බවක් නොමැති බවයි. ගස් කපා හෙළමින් , පැලැටි හා දහස් ගණන් සත්ව ජීවිත විනාශ කරමින්, කළ යාග හෝම පූජාවන්හි අර්ථශූන්‍යභාවය බුදුරජාණන් වහන්සේ **දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ** දි පෙන්වා දුන් සේක. තවද රාජ්‍ය පාලනයේදි ශාක සමූහය ද සත්ව සමූහය ද ආරක්ෂා කළ යුතු බව **දීඝ නිකායේ කූටදන්ත** හා **චක්කවත්තිසීහනාද** යන සූත්‍රවල දි පෙන්වා දි ඇත. කිසියම් ගසක් යට නිදා ගැනීමෙන් හෝ හිඳ ගැනීමෙන් ගසෙහි පිහිට ලබාගත් අයෙකු අතු ආදිය කඩා දැමීම අකෘතඥ වීමක් ගුණමකු වීමක් , මිත්‍රද්‍රෝහි වීමක් බව ජාතක පාලියේ භූරිපඤ්ඤ ජාතකයේත් සඳහන් වේ. තවද යම් පුද්ගලයෙක් මල්ඵල සහිත තුරුලතා වවයිද වන වගා කෙරේ ද , ඒ දඬු , පාලම් , පොකුණු , ආවාස තනා දෙයි ද , ඔහුට නිති දිවා රෑ පින් වැඩෙන බවත් ධර්මානුකූල සිල්වත් ජීවිතයක් ගත කරන ඔහු සුගතියට යන බවත් **සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයේ** සඳහන් වේ.

ප්‍රතිරූප දේශයක විසීම උභයාර්ථ ලෝක සිද්ධියට හේතුවන මංගල කරුණක් බව සඳහන් වන අතර සිගාලෝවාද සූත්‍රයේ දී සමාජය කොටස් හයකට බෙදා අන්‍යොන්‍ය සහජීවනය පිණිස ඉටුවිය යුතු යුතුකම් හඳුන්වා දී ඇත. බුදුරජාණන් වහන්සේ කිසි විටකත් තම ශ්‍රාවකයන් වහන්සේලාට පමණක් සංග්‍රහ කළ යුතු බව නො දක්වා ඇති අතර සියලු තැන්හි ම ශ්‍රමණ බ්‍රාහ්මණයින්ට සංග්‍රහ කරන ලෙස වදාරා තිබීමෙන් ද පැහැදිලි වන්නේ බාහිර සමාජ පරිසරයට බුදුන්වහන්සේ දැක්වූ ආකල්පයේ ස්වභාවයයි. බෞද්ධයා පරිසරය කෙරෙහි දැක්විය යුතු පරමාදර්ශි ආකල්පයේ ස්වභාවය සතර බ්‍රාහ්මවිහරණ වලින් ප්‍රකට වේ.

බුදුදහම පරිසරය කෙරෙහි දක්වන ආකල්පය බෞද්ධ අධිරාජ්‍යවාදියෙකු වූ ධර්මාශෝක රජතුමා විසින් පිහිටුවන ලද ධර්ම ලිපිවලින් ද පැහැදිලි වේ. එම ලිපිවලින් බුදුරජාණන් වහන්සේ විසින් සෘජුව ම නිර්වාණය අරමුණු කොට දේශනා කරන ලද ධර්මය රාජ්‍ය පාලනය සඳහා ධර්මාශෝක රජු විසින් සකස් කරගත් ආකාරය ප්‍රකට කරයි. බෞද්ධ රාජ්‍යයක ලක්ෂණ මේ යැයි පෙන්වා දෙන එම ලිපිවල දක්නට ලැබෙන

අදහස් කීපයක් විමසා බැලීම පශ්චාත් බෞද්ධ දැනුම් පද්ධතිවල , පරිසරය පිළිබඳව ක්‍රියා කළ ආකාරය සෙවීමේදී වැදගත් වේ. බෞද්ධ රජෙකු වූ ධර්මාශෝක රජතුමා අන්‍ය ආගම් කෙරෙහි දක්වා ඇති ආකල්පය සඳහන්වන පහත ප්‍රකාශනය අඩංගු වන්නේ 12 වන ගිරි ලිපියේ ය.

"ඒ ඒ කරුණෙහි අන්‍යාගමික පූජකයෝ ද , ඒ ඒ ආකාරයෙන් පිදිය යුත්තාහ. එසේ කරන්නේ ස්වකීය ආගමික පූජ්‍යයෙන් වැඩියෙන් වර්ධනය කරන්නේ ය. අන්‍යාගමික පූජ්‍යයන්ට ද උපකාර කරන්නේ වෙයි. නො එසේ කරන්නේ තමාගේ ආගමේ පූජ්‍යයන් ද සිඳින්නේ වෙයි. අන්‍යාගමික පූජ්‍යයන්ටද අපකාර කරන්නේ වෙයි. යම් කිසිවෙක් ස්වකීය ආගමික පූජ්‍යයන්ට පූජා කෙරේ ද ස්වකිය ධර්මය බබලවමු යි කියා ස්වකීය ධර්මය කෙරෙහි භක්තියෙන් අන්‍යාගමික පූජ්‍යන්ට ගර්හා කෙරේ නම් හෙතෙම එසේ කරන්නේ වැඩියත් ස්වකීය ධර්මය පෙළන්නේ වෙයි." [14]

බෞද්ධ භික්ෂූන් වහන්සේලාට මෙන් ම අන්‍යාගමික ශ්‍රමණ බ්‍රාහ්මණවරුන්ට ද විවිධ ආකාරයෙන් සංග්‍රහයන් කළ ධර්මාශෝක රජතුමා සත්ව ඝාතනය හැකිතාක් දුරට තම අධිරාජ්‍යය තුළ අඩු කළේ තමා ද රටවැසියාට ආදර්ශයක් වෙමිනි. එතුමා බාහිර පරිසරය කෙරෙහි දැක් වූ ආකල්පය හත්වන ටැම් ලිපියේ ඇති පහත ප්‍රකාශයෙන් ද පැහැදිලි වේ.

"දෙවියන්ට ප්‍රිය වූ ප්‍රියදර්ශී රජ මෙසේ කියයි. මාර්ගයන්හි ද මවිසින් නුග ගස් වවන ලදී. සිව්පාවුන්ට හා මිනිසුන්ට සෙවණ පිණිස මේවා කියයි. අඹ වතු වවන ලදි. අර්ධ කෝෂයකට එක බැගින් මවිසින් ළිං කරවන ලදි. තවාතැන් ද කරවන ලදි. සිවුපාවුන්ගේ හා මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ඒ ඒ තැන බොහෝ පැන් හල් කරවන ලදී. ... මේ ධර්මයට අනුව පිළිපදිත්වා යන මේ කාරණය සඳහා මෙසේ කරන ලදි.[15] තව ද යාග කිරීම තහනම් කළ රජතුමා සිවුපාවුන්ට හා මිනිසුන්ට වෙදකම් කළ අතර, තුන්වන ගිරි ලිපියේ ,වියදම් අඩු බව හා අඩු වූ දේපළ ඇති බව මැනවයි. සඳහන් කර තිබීමෙන් ද එතුමා ලද බෞද්ධ ආභාෂය ප්‍රකට කෙරේ.





මහින්ද මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් පසු ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් බවට පත්විය. ඉන් පසු ව අධ්‍යාපනය , වෙදකම, කෘෂිකර්මය, දේශපාලනය ආදී සෑම ක්ෂේත්‍රයක්ම බුදුදහමේ ආභාෂය ලැබීමෙන් වර්ධනය විය. අනුරාධපුරයේ ජේතවන , අභයගිරි වැනි පැරණි විහාර ආශ්‍රිත ව කරන ලද කැණීම්වල දී එකල භික්ෂූන් වහන්සේලා විසින් පරිහරණය කරන ලද කැසිකිලි විශේෂයෙන් සොයා ගෙන තිබේ. වැලි, අඟුරු පිරවූ විශාල මුට්ටි හතක් පමණ එක උඩ එක රඳවා භූගත කර එම කැසිකිළි සකස් කර ගෙන ඇති අතර ඒවායේ පතුල් සිදුරු කර ඇත. එහි දි ඉහළින් ම තිබෙන මුට්ටියට වැටෙන මුත්‍රා හත්වැනි මුට්ටියෙන් පෙරී ගොස් පරිසරයට එක්වන්නේ කිසිදු හානියක් නො වන පරිදි ය. මින් පැහැදිලි වන්නේ ඈත අතීතයේ දී පවා ප්‍රතිචක්‍රීකරණ සංකල්පය , බුදුදහමින් පෝෂණය වූ සිංහල සමාජයේ භාවිත වූ බව පමණක් නොව පරිසරය පිළිබඳ බෞද්ධයන් දැක් වූ ආකල්පයේ ද ස්වභාවය යි. ගොවිතැන ප්‍රධාන ජීවනෝපාය කරගත් සිංහලයා ගොවිතැනේ දී භාවිත කළ කෙටි පහන් ක්‍රම මගින් පවා පරිසරය පිළිබඳ දැක් වූ බෞද්ධ ආකල්පයේ ස්වභාවය ප්‍රකට වේ.

ශ්‍රී ලංකාවේ කෙම්පහන් ක්‍රම පිළිබඳ ව එච්. එම්. ඩී. ආර්. හේරත් ආචාර්යතුමා කළ අධ්‍යයනයක මෙසේ සඳහන් කර ඇත.

"සිංහල බෞද්ධ කෙම් ක්‍රම බොහෝමයක් තුළ විද්‍යාව, අභිචාර සහ ආගම යන අංශයන් තුන අඩංගු වේ. කෘෂිකාර්මික කටයුතුවලදී ඉටු කරනු ලබන විවිධ කෙම් පහන් ක්‍රම අතර පරිසරයට හානි නො වන පරිදි පලිබෝධක මර්දනය රෝග සුවපත් කිරීම පමණක් නොව මිනිසාට වැල්දී තිබෙන නොයෙකුත් ආපදාවන්ට ද මේ මගින් සහනයක් ලබා දෙයි. ශ්‍රී ලංකාවේ මෙවන් පරිසර හිතකාමී කෙම්ක්‍රම දහස් ගණනක් දක්නට ලැබේ."

පරිසරය පිළිබඳ දක්වන බෞද්ධ ආකල්පයට බොහෝ දුරට සමාන ආකල්පයක් දක්වන චින්තනයක් ලෝකයේ තවත් ඇත. රතු ඉන්දියානු චින්තනය , ෂින්තෝ චින්තනය කොන්ෆියුසියස් චින්තනය ආදි චින්තනයන් ඊට නිදසුන් කිහිපයකි.

රතු ඉන්දියානු නායකයා වූ සියැටල්තුමාට එවකට ඇමෙරිකානු ජනාධිපතිවරයා ව සිටි ප්‍රැන්ක්ලින් සියර්ස් මහතා විසින් ලිපියක් යවන ලදී .රතු ඉන්දියානුවන්ට අයත් ඉඩම්, ඇමෙරිකානු සුදු ආණ්ඩුවට විකුණන ලෙස එම ලිපියෙන් ඉල්ලා තිබුණු අතර සියැටල්තුමා ඊට පිළිතුරු ලිපියක් යවන ලදි. එම පිළිතුරු ලිපියේ සඳහන් පහත දැක්වෙන අදහස්වලින් පැහැදිලි වන්නේ පරිසරය පිළිබඳ රතු ඉන්දියානුවන් දැක් වූ ආකල්පය වේ.

"... අපි මිහිතලයේ කොටසක් වන්නෙමු. මිහිතලය ද අපගේම කොටසක් වන්නේ ය. සුගන්ධවත් පුෂ්පයෝ අපේ සොහොයුරියෝ ය. පිනිමුවා , අශ්වයා , මහා රාජාලියා මේ සියල්ලෝම අපගේ සහෝදරයෝ වෙති. සුදු මිනිසුන් තම මවටත් සහෝදරයාටත් , මහ පොළොවටත්, ඔහුගේ අහස් තලයටත් සලකන්නේ මිළට ගත හැකි කොල්ල කෑමට හෝ විකිණීමට හැකි බැටළුවන් හෝ දිප්තිමත් පබළු වැනි දෑ ලෙසිනි. ඔවුන්ගේ කෑදරකම් විසින් මේ භූමියේ සාරය උරා බොනු ලැබීමෙන් පසු ඉතිරි වන්නේ හිස් කාන්තාරයක් පමණි.... ජීවිතය නැමැති දැල මිනිසා විසින් වියන ලද්දක් නොවේ. ඔහු එහි නූල් පොටක් පමණි. මිනිසා එම දැළට යම් හානියක් කරතොත් ඒ තමාට ම කරගන්නා උපද්‍රවයකි." [16]

වර්තමාන ජපානයේ භයානක පරිසර විනාශයක් පවතින බවත් ඊට හේතුව ජපන් මිනිසා බෞද්ධ හා ෂින්තෝ ආකල්පවලින් බැහැරව, බටහිරයන්ගේ පාරිසරික ආකල්ප පිළිගෙන ක්‍රියා කිරීම බවත් දයිසකු ඉකෙදා ආචාර්යතුමා පෙන්වා දි ඇත. ශ්‍රී ලාංකාව ද බටහිර අනුකරණය කරමින් ඔවුන්ගේ "සංවර්ධනය" පිළිගෙන ඊට අනුව කටයුතු කිරීමට උත්සාහ කරන රටක් ලෙස හැඳින්වීම අසත්‍යයක් නොවේ. එසේ කිරීම නිසා දැනටමත් උග්‍ර පාරිසරික ගැටලු රාශියක් ඇති වී තිබෙන අතර ඉදිරියේ දී ඒවා තවත් සංකීර්ණ වනු ඇත.





අනාගතයේ දී ඇති විය හැකි උග්‍ර පාරිසරික අර්බුදයන්ට විසඳුම් සෙවිය හැක්කේ මිනිසාගේ ආශාවන් සීමා කරන අල්පේච්ඡතාව අගය කරන තමා ද පරිසරයේ කොටසක් පමණක් බව සිතන සමාජ ක්‍රමයක් මගින් පමණි. එබැවින් අප අපගේ මුතුන් මිත්තන් පරිසරය සමග සබඳතා පැවැත් වූ ආකාරයට ක්‍රියා කළහොත් පමණක් පරිසරයට මෙන් ම පරිසරයේ ම කොටසක් වන මිනිසා ප්‍රධාන ජීවීන්ගේ ද සුරක්ෂිත බව තහවුරු වනු ඇත. සියලු සත්ත්වයන්ගේ සුරක්ෂිත බව ඇති කළ හැක්කේ මිථ්‍යා දිට්ඨිය පදනම් කරගත් චින්තනයකට නොව ලෝකය පිළිබඳ නිවැරදි දැකිම හෙවත් සම්මා දිට්ඨිය මත පදනම්ව ගොඩනැගුණු චින්තනයකට අනුව කටයුතු කිරීමෙන් පමණි." [17]

චාම් බව හා අහිංසාව නිසැකයෙන් ම එකිනෙකට ඉතා කිට්ටු සම්බන්ධයෙකින් යුතු ව පවති. තාඩන පීඩන වලින් නොපෙළී ජීවත්වීමට හා බෞද්ධ ධර්මයෙන් උගන්වනු ලබන පරිදි පව් කිරීමෙන් වලකින්න පින් කිරීමට වෑයම් කරන්න. යන අවවාදාත්මක තහනම් ඉෂ්ට කිරීමට සාපේක්ෂ ලෙස පහත් පරිභෝජන සිඝ්‍රතාවෙකින් යුතුව මානව තෘප්තියේ උච්ඡ තත්ත්වයකට පැමිණීමට හොඳ ම පරිභෝජන රටාවෙන් ඉඩ සැලසෙන්නේ ය. භෞතික සම්පත් ලොවේ සෑම තැන්හි ම එක තරමින් නොමැති හෙයින් තියෙන සම්පත් ප්‍රමාණවත් තරමින් ප්‍රයෝජනයට ගනිමින් තම තමන්ගේ වුවමනාවන් සිහි බුද්ධියෙන් යුක්තව සපුරා ගන්නා මිනිසුන් ඒවා සිඝ්‍රයෙන් වැඩට යොදවන මිනිසුන්ට වඩා එකිනෙකාගේ බෙලි කපා ගැනීමට තරම් අරගල නො කරනු ඇති බව ඉතා පැහැදිලි කරුණකි. එලෙස ම මුලු ලොව පැතිරී ඇති වෙළහෙළදාම් ක්‍රම කෙරෙහි විශ්වාසය තබන මිනිසුන්ට වඩා ප්‍රාදේශීය ස්වයංපෝෂිත ප්‍රජාවන් විශාල හිංසාවාදී අරගලවල නොයෙදී සාමයෙන් ජීවත් වනු ඇතැයි සිතිය හැක.

බටහිර මිනිසා ගැන **බර්ට්‍රන්ඩ් ද ජුවනල්** නැමැති සුප්‍රසිද්ධ දේශපාලන දාර්ශනිකයාගේ විස්තරය නවීන ආර්ථික විද්‍යාඥයන්ට ගැළපෙන බව පෙනේ.

ඒ මෙසේ ය. " හේ මිනිස් ප්‍රයත්නය හැර අන් කිසිවක් වැයමක් ලෙස නො ගැනීමට හුරුකමක් දක්වයි. කොතරම් ඛණිජ ද්‍රව්‍ය අපතේ යවනු ලැබේ ද , එයටත් වඩා බරපතල වරදක් වන , කොතරම් ප්‍රාණීන් විනාශ කරනු ලැබේද යන කරුණු හේ ගණන් නොගනී. අපමණ ජීවීන් සංඛ්‍යාවකින් සෑදී ඇති ජීවීපරිස්ථිති පද්ධතියක මානව ජීවිතය ද එය මත ම රදා පවත්නා කොටසක් බව ඔහුට අවබෝධ නොවන්නාක් සේ පෙනේ. ලෝකය පාලනය කැරෙන්නේ මිනිසුන් හැර අන් ආකාරයේ ජීවීන්ගෙන් වෙන් වී ඇති මිනිසුන් ගෙන් යුත් නගර වලින් නිසා ජීවි පරිස්ථිති පද්ධතියට ජීවීන්ද අයිතිය යන හැඟීම නැවත ඇති වන්නේ නැත. අපට මූලික වශයෙන් වුවමනා කරන ජලය ගස් වැලි ආදිය බඳු දේ ගැන දුර දිග නොබලා ඉතා අවිචාරවත් අන්දමින් සැලකීමයි මෙහි ප්‍රතිඵල ය.

බුදුන්වහන්සේ විශේෂ අවධාරණයකින් උගන්වන්නේ සචේතනික සතුනට පමණක් නොව ගස් වැල්වලට ද ගෞරවය දක්වමින් හිංසාවෙන් තොර පැවැත්මක් පෑ යුතු බවෙකි. හැම බෞද්ධයෙක්ම වර්ෂ කිපයකට වරක් පැළ ගසක් සිටුවා එය හැදෙන බව සහතික වන තෙක් රැක බලා ගත යුතු බවයි. මේ නියාමය සියල්ලන් විසින් පිළිපැද්දොත් බෞද්ධ ආර්ථික විද්‍යාඥයාට පිළිවත අපහසුවක් නැතිව පෙන්වා දීමට හැක. කිසිම විදේශ විනිමයක පිහිට නොමැතිව මෙයින් විශාල ආර්ථික සංවර්ධනයක් සිදුවන බවත් අග්නි දිග ආසියාවේ ආර්ථික අහේනියට නිසැකව ම හේතු වී ඇත්තේ ඉවක් බවක් නැති නො සැලකිල්ලකින් යුතු ව ගස්වැල් ආදිය විනාශ කිරීම යි.

මුදලින් මිළ කර සම කිරීම හා ප්‍රමාණය මෙ පමණ යැයි මුදලින් අගය කිරීම නවීන ආර්ථික විද්‍යාවේ පිළිවෙත බැවින් නැවත ලබාගත හැකි දේ මේ යයි ද නොහැකි දේ මේ යයිද වෙන් වෙන් වශයෙන් තෝරා සැලකීම එහි සිරිත නොවේ. එසේ ගල් අගුරු , ඛණිජතෙල්, දර ආදී එකිනෙක වෙනුවට මාරුකළ හැකි ඉන්ධන හෝ ජල බලය හෝ ගතිතොත් නවීන ආර්ථික විද්‍යාඥයා ගණන් ගන්නේ ඒවායේ සමාන ඒකකවල සාපේක්ෂ මිළය යි. මිලෙන් අඩුම ද්‍රව්‍යය යි. නිරායාසයෙන් ම තෝරා ගන්නේ එසේ





නොකිරීම ඔහුට තේරුමක් නොමැති "නිරර්ථක " ක්‍රියාවකි. බෞද්ධ මතය අනුව නම් විය යුත්තේ මෙය නොවේ.

නැවත උපදවා ගැනීමට නුපුළුවන් ගල් අගුරු, ඛණිජ තෙල් වැනි දේත් නැවත උපදවා ගත හැකි දර හා ජලය වැනිදේත් අතර ඇති ඉතා වැදගත් වෙනස නොසලකා හැරිය නො හැකි ය. නැවත නුපදවා ගත හැකි දේ භාවිත කළ යුත්තේ ඒවා නැතිව ම බැරි අවස්ථාවලදී ඉතා අරපරිස්සමෙන් හා සුරක්ෂිත භාවයකිනි. ඒවා දුර දිග නොබලා වුවමනා පමණට වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම හිංසාකාරී ක්‍රියාවෙකි. පූර්ණ හිංසාව මිහිපිට මුදුන් පමුණුවා ගැනීමට නුපුළුවන් විය හැකි වන නමුදු කරන හැම කටයුත්තකදීම අහිංසාවෙන් වැඩ කිරීම අරමුණු කොට ගැනීම මිනිසා වෙත පැවරෙන පරම යුතුකම වන්නේ ය.

මේ අනුව බලන විට බුදුදහම තුළ ජීව පරිසරය කෙරෙහි පමණක් නොව අජීව පරිසරය විෂයයෙහි දැක්විය යුතු ආකල්පය මැනවින් දක්වා ඇත. අජීව පරිසරයට අයත් වන්නේ ශාක - සත්ව යන අංශ දෙකට අයත් නොවන ස්වභාවික සම්පත් ය. ආහාර, වස්ත්‍ර , නිවාස හා බෙහෙත් යන මූලික අවශ්‍යතා ඇතුලු නොයෙක් දේ මිනිස් පැවැත්ම සඳහා අත්‍යවශ්‍යය . ඒ අවශ්‍යතා සපුරා ගැනිමේ දි දිගුකාලින ලෙස ස්වභාවික සම්පත් පරිභෝජනය කළ හැකි නිවැරදි පිළිවෙතක මනුෂ්‍යයා ක්‍රියා කල යුතු ය. මෙය බුදුදහමේ "සම්මා ආජීවයට" අන්තර්ගත වන්නකි. [18]

මිනිසා කෑදර කම සපුරාලීමට නොව අවශ්‍යතා සංතෘප්තියට උගත යුතු ය. සම්පත් අසීමිත නොවේ. එහෙත් මිනිසාගේ කෑදරකම ලෝකයේ සම්පත් වල සිමිත බව හෝ තෘප්තිය හෝ නො දනියි. නූතන මිනිසා අසීමිත ලෙස ඉන්ද්‍රිය පිනවීමෙන් , ධනෝපායනයෙන් ස්වභාවික සම්පත් අසිමිත ලෙස පාවිච්චි කිරීම නිසා ලෝකය දිළිඳු බව කරා ඇදී යමින් පවතී. මේ අසීමිත පරිභෝජනය විචාරයට ලක් කරන **ඊ. එෆ්. ෂුමාකර් සිය "Small is Beautiful"** නම් කෘතියේ දී ගාන්ධිගේ වචනයක් දක්වා තිබේ. හැම මනුෂ්‍යයකුගේම අවශ්‍යතා සපුරා ලීමට මහ පොළොවට පුළුවන් කමක්

ඇත. එහෙත් හැම මනුෂ්‍යයකුගේ ම කෑදරකම සපුරා ලීමට එයට නොහැකිය.

"සන්තුට්ඨී" යන සංකල්පයට බෞද්ධ ජීවන වැඩ පිළිවෙළේ දි වැදගත් කමක් පිරිනැමෙන්නේ ඒ නිසා ය. "**සන්තුට්ඨී පරමං ධනං** " මින් අදහස් කරන්නේ සංතෘප්තියයි. සෑහීමකට පත් වීමයි. අවශ්‍යතා සිමාවන් දැක්වීමයි. මේ ආකල්පය අජීව පරිසරයට අයත් සියල්ලෙහි මනා සුරක්ෂිතභාවයට වැදගත් වේ.

ආර්ථික හා සමාජ සංවර්ධන විෂයෙහි අද එකම මිනුම් දණ්ඩ වී ඇත්තේ මුදල මුල් කොට ගත් බටහිර ආකල්පයන් ය. ලෝකයේ ආර්ථික හා දේශපාලන විශේෂඥයන් අදහස් කරනුයේ කුමන ආකාරයෙන් හෝ ධනය වැඩි කර ගැනීමේ ක්‍රියා මාර්ගයන් ය. ආර්ථික වශයෙන් ඉහළ ම හිණිපෙත්තට නැග ඇති ඇතැම් රටවල උද්ගත වී ඇති ගැටළු නිරාකරණය කිරීමට එම රටවල සමාජ විද්‍යාඥයින්ට බලවත් සටනක යෙදීමට සිදුව ඇත.

නවීන තාක්ෂණය උපයෝගි කර ගෙන කර්මාන්ත සංවර්ධනය කළ හැකි වුවත් ධනය උපයා ගත හැකි වුවත් මානසික සහනයක් ලබා ගැනීමට මේ ද්විත්ව ක්‍රියාකාරීත්වයෙන් ම නොහැකි බව අද පිළිගැනිමට ලක්ව ඇත. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ධනවාදී රටවල මෙන්ම සමාජවාදය ක්‍රියාත්මක වූ රටවල ද ආර්ථික හා සාමාජික ප්‍රශ්න අද විශාල වශයෙන් පැන නැගී ඇති අතර ඒවාට විසඳුම් මේ ක්‍රම දෙකෙන්ම හෝ විවෘත ආර්ථික ක්‍රමයෙන් සොයා ගත නො හැකි ව ඇත. මේ තත්වයන් යටතේ පෙරපර දෙදිග ආර්ථික හා සමාජ විද්‍යාඥයන්ට මීට පරිබාහිර ක්‍රම සහ විධි පිළිබඳ අත්හදා බලන්නට සිදු වී ඇත. දිනෙන් දින උග්‍ර වන සමාජ ප්‍රශ්න , අපරාධ , දූෂණ , අසාධාරණ ඉදිරියේ ආර්ථික සංවර්ධනය ඉක්ම වූ සමාජ සාරධර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමට මේ සමාජ හා ආර්ථික විශේෂඥවරුන්ට අද සිදුවඇත.





මේ තත්ත්වය යටතේ 21 වන සියවස තුළ සිටින නූතන ලෝකයට බෞද්ධ දර්ශනයෙන් ලබාගත හැකි පිටුවහල ඉමහත් බව ඒ පිළිබඳව පිරික්සන්නෙකුට මනාව අවබෝධ වේ. මීට සියවස් විසිපහකට පෙර පහළ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ආර්ථික හෝ සමාජ විද්‍යාඥයකු නොවූ සේක. එසේ වුව ද , එදා ක්‍රි. පූ. 6 වන සියවසට වඩා අද 21 වන සියවසට පවා ගැලපෙන ආර්ථික හා සමාජ මූලධර්ම රැසක් යම් යම් අවස්ථාවලදි ගෙන හැර දක්වා ඇත. උන්වහන්සේ පෙන්වා දුන් උපදෙස් අවිහිංසාව සහ ජීව හිතවාදය පදනම් කරගත්තකි.

**අංගුත්තර නිකායේ වණිජ්ජා සූත්‍රයට** අනුව බෞද්ධයන් විසින් පස් වැදෑරුම් වෙළදාමෙන් වැලකිය යුතු ය.

| | | |
|---|---|---|
| 1. | අවි ආයුධ වෙළදාම | (සත්ථ වනිජ්ජා) |
| 2. | සතුන් හෝ මිනිසුන් වෙළදාම | (සත්ත වනිජ්ජා) |
| 3. | මස් පිණිස සතුන් වෙළදාම | (මංස වනිජ්ජා) |
| 4. | මත්පැන් වෙළදාම | (මජ්ජ වනිජ්ජා) |
| 5. | විෂ ද්‍රව්‍ය වෙළදාම | (විස වනිජ්ජා) |

මේ අනුව සිදු කරනු ලබන වෙළදාම අවිහිංසාව හා මෛත්‍රිය යන සංකල්ප පදනම් විය යුතු බව පෙන්වා දී ඇත.

ලොව කවර සමාජයක වුව ද දියුණුව , අසාහසික ව ලබා ගැනීම ශිෂ්ට සම්මත වේ. පෞද්ගලික වශයෙන් වුව ද රාජ්‍ය ව්‍යවසාය වශයෙන් වුව ද එහි භේදයක් නොවේ. එසේ ම බුදු සමයේ පුද්ගලයාගේ දියුණුවේ රහස රදා පවත්තේ පුද්ගලයා තුළ බව අවධාරණය කර ඇති අතර කර්මයට හෝ සර්වබල ධාරියෙකුට පවරා නැත. දිළිඳුකම දුකක් **(දාළිද්දියං භික්ඛවේ දුක්ඛං)** දුක නැති කර ගත හැක්කේ වීර්යයෙන් කටයුතු කිරීමෙන් පමණි. **(වීරියේන දුක්ඛං අච්චෙති)** නිරන්තරයෙන් ම බුදු සමය අගය කොට ඇත්තේ කායික ශ්‍රමය අභිමානයෙන් සැලකීමයි. හොරකමින් තක්කඩිකමින් හෝ ලෙහෙසියෙන් මුදල් ඉපයීම ද , පසස්නා ලද්දේ නොවේ. දැඩි උත්සාහයෙන් **(උට්ඨාන වීරියාධි ගතා)** දැතේ වීර්යයෙන් (බාහා බල පරිචිතා) දහඩිය මහන්සියෙන් (සෙදාවක්ඛිත්ත) ආදි සඳහන්වලින් ඊට අගයක් ලබා දී ඇත.

5. බෙල්ලන ඥානවිමල නාහිමි, අශෝක ශිලාලේඛන ,
සමයවර්ධන - 2000

6. මීගොඩ පඤ්ඤාලෝක හිමි. බුදුදහම පරිසරය හා අධ්‍යාත්ම
සුන්දරත්වය, කොළඹ - 1999

7. මාගධී ශාස්ත්‍රීය සංග්‍රහය, 06, කළඹ - 1992

8. දිනමිණ වෙසක් කලාපය , 66 වන කලාපය , 1998

9. සම්භාෂා , 12 වැනි කලාපය 2002

10. වෙසක් කලාපය ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
1996

11. දිවයින ඉරිදා සංග්‍රහය (2001 අප්‍රේල් 29)

12. කොස්වත්තේ අරියවිමල හිමි,'බුද්ධ ධර්මය' උසස් පෙළ ,
සමයවර්ධන - 1996

13. උප්පත්ති, ශුද්ධ බයිබලය, පිට 02

14. බෙල්ලන ඥාණවිමල හිමි. අශෝක ශිලා ලේඛන ,
පිට 24

15. එම , 59 පිට

16. දිවයින ඉරිදා සංග්‍රහය 2001 අප්‍රේල් 29

17. සම්භාෂා ශාස්ත්‍රීය සංග්‍රහය 2002. පිට 693 - 702

18. කොස්වත්තේ අරියවිමල හිමි. බුද්ධ ධර්මය, පිට 279

19. ඩබ්ලියු එස්. කරුණාරත්න - බෞද්ධ දර්ශනය හා චරණය